# ග්‍රාමීය විවාහක කාන්තාවන්ගේ පෞද්ගලික ස්වස්ථතාව ඔවුන් සතු  ලිංගික දැනුම මත පදනම් වන්නේද? (මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ජේ. ඒ. එන්. දිල්හානි**[1]

**තුල්සි අලහකෝන්**[1]

**සංක්ෂේපය**

දේශීය සංස්කෘතිය තුළ විරල ලෙස විවෘත සාකච්ඡාවට බඳුන් වන සංකල්පයන් ලෙස මෙම පෞද්ගලික ස්වස්ථතාව හා ලිංගිකත්වය හැඳින්විය හැකිය. මෙහිදී දැනුම සැඟවීමෙන් තොර නිවැරදි සෞඛ්‍ය අධ්‍යාපනය මඟින් පාසැල් පද්ධතියේ පටන් සමස්ත සමාජ පද්ධතිය පුරාම මීට අදාළ දැනුම ව්‍යාප්ත කිරීමේ හැකියාව පවතී.

ග්‍රාමීය පහළ සමාජ ආර්ථික මට්ටම් සහිත විවාහක කාන්තාවන්ගේ පෞද්ගලික ස්වස්ථතාව ඔවුන් සතු සෞඛ්‍ය අධ්‍යාපනය හා ලිංගික දැනුම මත පදනම් වන්නක්ද ? යන්න ගැටලුව වන අතර එය පදනම් කොටගෙන  ග්‍රාමීය ප්‍රදේශයන් හී කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම්, ලිංගික දැනුම, සෞඛ්‍ය මට්ටම් හා සෞඛ්‍ය චර්යා, අඩු වයස් විවාහ, ලිංගික ආසාදන තත්වයන්, ගර්භණී සුරක්ෂිතතාව  යන සියල්ල අධ්‍යයනය කිරීම මෙහි දී අරමුණු කෙරේ.

මෙහිදී ප්‍රාථමික දත්ත ක්ෂේත්‍ර සමීක්ෂණය තුළින් හා ද්විතියික දත්ත පොත්පත්, සඟරා, අන්තර්ජාලය ආශ්‍රයෙන් සපයා ගැනෙන අතර නියැදි රාමුව සකස් කිරීම සඳහා සරල සසම්භාවී නියැදුම් ක්‍රමය භාවිත කොට ඇත. මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි වසම් 26 අතරින් අඩු ආදායම් ලාභීන් වැඩි ප්‍රමාණයක් සිටින වසම් 5 තුළින් ගම්මාන 5 සහ එම එක් ගම්මානයකින් තෝරා ගත් පවුල් 20 වන සේ  විවාහක කාන්තාවන් 100කින් යුත් නියැදියක් තෝරා ගන්නා ලදි. මෙම තෝරා ගැනීම් සඳහා ග්‍රාම නිලධාරී හා අදාළ වසම් හි පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගෙන් ලද තොරතුරු භාවිතකර ඇත. ප්‍රශ්නාවලියකට අනුව අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු ලබා ගැනීම සිදු විය. ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් දත්ත විශ්ලේෂණයට බඳුන් කෙරෙන අතර ඒ සඳහා Ms excel 2013 භාවිත කොට ඇත. මෙහි ප්‍රතිඵල අනුව ග්‍රාමීය විවාහ අතරින් 48% අඩු වයස් විවාහ බවත් 52% අඩු ආදායම් ලාභි පවුල්වලට අයත් වන අතර 42% සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇත. 46% කුමන හෝ ලිංගික ආසාදනයකින් පෙළෙන අතර සනීපාරක්ෂක තුවා භාවිතය දැකිය හැක්කේ 32% පමණි නමුත් 78% උපත් පාලන භාවිත කරන බව පැහැදිලිව දක්නට ලැබේ. එහිදී සෞඛ්‍ය අධ්‍යාපන හා ලිංගික දැනුම මත ස්වස්ථතා මට්ටම තීරණය වන බවය නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** ස්වස්ථතාව, සෞඛ්‍ය අධ්‍යාපනය, ලිංගික දැනුම, විවාහය, ග්‍රාමීය කාන්තාව

---

Sadilhani99@gmail.com  විශේෂවේදී තෙවන වසර, දර්ශන අධ්‍යයන අංශය *කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*
thulcy@yahoo.com කථිකාචාර්ය ,දර්ශන අධ්‍යයන අංශය *කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*